බාලවයස් ලිංගික අපයෝජනයක් යනු නීතියෙන් දඬුවම් ලැබෙනා වරදක් බව නොකිවමනායි. කෙසේ නමුත්, ඇතැම් විට මාධ්‍ය තුළ බාලවයස් ලිංගික අපයෝජනයක් වැනි සිදුවීමක් වාර්තා වන ආකාරය අනුව, එම වරදෙහි සැබෑ ස්වභාවය ඉදිරිපත් වන්නේද යන්න පැනයකි.

ඊට උදාහරණ ලෙසින්, "දහම් පාසලේ ප්‍රධානාචාර්යගෙන් සාමණේර හිමියන්ට කරදරයක්" යන සිරස්තලය සමගින් ඉදිරිපත් වන පුවත දැක්විය හැක. නමුත්, මෙහි පුවත් අන්තර්ගතයට අනුව මෙය බරපතළ ළමා ලිංගික අපයෝජනය සිදුවීමකි.

1) එසේ ගත් විට, මෙම සිරස්තලයෙන් අදාළ සැකකරුවා විසින් බාලවයස්කරුවෙකු හට "බරපතළ ලිංගික අපයෝජනයක්" සිදු කර ඇති බවක් ගම්‍ය වේ යැයි ඔබ සිතන්නේ ද?

2) එසේ නැති නම්, එය ලිංගික අපයෝජන වරදක් සිරස්තලය තුළින් සැහැල්ලු කොට ඉදිරිපත් කිරීමක් නොවන්නේ ද?

3) ඒ ඔස්සේ එවැනි වරදක් සාමාන්‍යකරණය වීමේ ඉඩක් ඇතැයි ඔබ සිතන්නේ ද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?